*සැ. යු.* — 2014.07.11 දින පළ වූ අංක 1,871 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,872 - 2014 ජූලි මස 18 වැනි සිකුරාදා - 2014.07.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 914 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 924 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 927 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 අගෝස්තු මස 08 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජූලි මස 25 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## අකුරණ ප්‍රාදේශීය සභාව

අකුරණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අකුරණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වූ තනතුරු සඳහා ඉල්ලුම් කරන්නන් පහත සඳහන් පොදු සුදුසුකම් වලින් සමන්විත අයවළුන් විය යුතුයි.

01.1 *පොදු සුදුසුකම් :-*

*(අ)* ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය. මධ්‍යම පළාතේ ස්ථිර පදිංචි අයෙකු විය යුතු ය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03ක අඛණ්ඩ පදිංචියක් තිබිය යුතු ය ;

*(ආ)* තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. පළාත් පාලන ආයතනයක සේවයේ යෙදී සිටින අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ ;

*(ඉ)* අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා කායික සහ මානසික වශයෙන් මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු අතර, පත්වීම් ලබා මාසයක් ඇතුළත නියමිත සුදුසුකම් ඇති වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේ දී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ ;

*(ඊ)* දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය ;

*(උ)* රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහ කරනු ලැබූවකු නොවිය යුතු ය.

02. *පුරප්පාඩු පවතින තනතුරු :-*

02. 1 බර යන්ත්‍ර ක්‍රියාකරු - III පන්තිය - පුරප්පාඩු 01
(ශිල්පීය)

| *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|
| PL3-2006A<br>රු. 12,470 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 = රු. 18,860 (මාසික) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.) අවම උස අඩි 5 අඟල් 2 1/2ක් විය යුතු ය. දිවා කාලයේ දී සහ රාත්‍රී කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක සිටිය යුතු අතර, මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය. |
| (ii) වෘත්තීය සුදුසුකම් | මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. බර වාහන පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් (වාහන පංතිය A) ලබා තිබිය යුතුය. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අදාළ සහතිකය ලබා තිබිය යුතු ය.) බර යන්ත්‍ර ක්‍රියාකරවීම, මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ පිළිගත් ආයතනයක වසරක පුහුණුව) |
| (iii) පළපුරුද්ද | බර යන්ත්‍ර ක්‍රියාකරවීමේ, අවම වශයෙන් වසර 02ක පළපුරුද්ද. |

02.2 ඖෂධ සංයෝජක - III පන්තිය - පුරප්පාඩු 01
(අර්ධ ශිල්පීය)

| | |
|---|---|
| *වැටුප් ක්‍රමය*<br>PL2-2006A<br>රු. 12,210 - 10 x 130 - 10 x 145 - 10 x 160 - 12 x 170 = රු. 18,600 (මාසික) | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතුය. |
| (ii) ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා | වෘත්තියට අදාළව වසර කට නොඅඩු පුහුණු පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෘත්තියට අදාල ජාතික වෘත්තීය පුහුණුකම් 2 මට්ටම (NVQ 2)හෝ 3 මට්ටම (NVAQ3) හෝ සමාන සහතිකපත් ලබා තිබීම. |
| (iii) පළපුරුද්ද | අදාළ ක්ෂේත්‍රයේ යටත් පිරිසෙයින් වසර 2ක පළපුරුද්ද |

*අධ්‍යාපන සුදුසුකම්*

02.3 පුස්තකාල සහායක - III පන්තිය - පුරප්පාඩු 02
(ශිල්පීය නොවන
*වැටුප් ක්‍රමය*
PL1-2006A
රු. 11,730 - 10 x 120 - 10 x 130 -
10 x 145- 12 x 160 = රු. 17,600 (මාසික)

දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථය ලබා තිබිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
(iii) පත්වීම වසර 03ක පරිවාස කාලයකට යටත්වන අතර, එම කාලය තුළ සතුටුදායක ලෙස සේවය නොකළහොත් පත්වීම ස්ථිර නොකර සේවය අවසන් කරනු ඇත.
(iv) ඉහත සඳහන් තනතුරුවලට අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

04. *බඳවා ගැනීමේ පිළිවෙල :-*

(i) බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුර සඳහා වන අයදුම්කරුවන් හැර අනෙකුත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.
(ii) බර යන්ත්‍ර ක්‍රියාකරු තනතුරේ වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත අවශ්‍ය සියලුම සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් ඉහළම ලකුණු ලැබූවන් අතුරෙන් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.
(iii) සභාවේ දැනටමත් සේවයේ නියුක්ත සේවකයින්ට බඳවා ගැනීමේ දී ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

05. *ඉල්ලුම්පත් එවිය යුතු පිළිවෙල :-*

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2014.07.21 වැනි දිනයට පෙර ''ලේකම්, අකුරණ ප්‍රාදේශීය සභාව, අලවතුගොඩ'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(ii) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හා අඩුපාඩු සහිත හෝ මෙම දැන්වීමේ සුදුසුකම් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකියනු නොලැබේ.

06. *සහතික පිටපත් :-*

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) අමුණා එවිය යුතු ය. (ඡායා පිටපත් වඩාත් සුදුසු වේ)

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික
(iii) තමාගේ පදිංචිය තහවුරු කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අනු අත්සන් කළ) ;
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක් (එකක් තමා පදිංචි කොටසේ ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය.) ;
(v) පළපුරුද්ද සනාථ කෙරෙන ලිපි ;
(vi) බර යන්ත්‍ර ක්‍රියකරු තනතුර සඳහා අයදුම් කරන්නන් රියදුරු බලපත්‍රයේ පිටපත.;

07. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනසක් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

08. යම් අයදුම්කරුවෙකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමකින් වුවද අයථා සංග්‍රහ පැතීම හෝ එහිලා බලපෑමක් කිරීමට තැත් කිරීම, එම අයදුම්කරු නුසුදුස්සෙකු කිරීමට හේතු වනු ඇත.

ටී. එස්. රාජපක්ෂ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 16 වැනි දින,
අලවතුගොඩ,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

## ආදර්ශ අයදුම්පත්‍රය

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම*

අකුරණ ප්‍රාදේශීය සභාව ............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය

1. මුලකුරු සමග නම :——————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම්:——————————.
2. ස්ථිර පදිංචි ලිපිනය :——————————.
3. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:——————————.
4. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
5. උපන් දිනය ፡ වර්ෂය:——————————.,මාසය:——————————. දිනය:——————————.
6. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස ፡ අවුරුදු :——————————., මාස:——————————., දින:————————.,
7. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
8. විවාහක/අවිවාහක බව:——————————.
9. ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද ? යන වග:——————————.
10. ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම්:——————————.
11. අධ්‍යාපන සුදුසුකම්: (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
    අ.පො.ස. (සා.පෙළ.) විභාගය සමත් වර්ෂය ፡
    විභාග අංකය :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 01. | | 05. | |
| 02. | | 06. | |
| 03. | | 07. | |
| 04. | | 08. | |

12. (i) වෙනත් සුදුසුකම් :——————————.
    (ii) වෘත්තීය සුදුසුකම්:——————————.
    (iii) සේවා පළපුරුද්ද:——————————.
13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර:——————————.
    ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ආදේශක ද යන වග:——————————.
    එම තනතුරට පත්වූ දිනය :——————————.
14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?:——————————.
15. රියදුරු තනතුර සඳහා අයදුම්කරුවන් පමණක් මෙම කොටස පිරවිය යුතු ය.
    (i) රියදුරු බලපත්‍ර අංකය:——————————.
    (ii) බලපත්‍රය වලංගුවන දිනය:——————————.
    (iii) බලපත්‍ර පන්තිය:——————————.

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති ඉහත තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම භාර ගනු ලැබීමෙන් පසු එය ඔප්පුවුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි.

——————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ........................................ මහතා/මිය/මෙනවිය මෙම ආයතනයේ ......................... ක වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:——————————.
තනතුර:——————————.
ආයතනය:——————————.
දිනය:——————————.
07-398

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව

කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| (1) | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 01 | PL1-2006A<br>රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160 = රු. 17,600 | 08 වන ශ්‍රේණිය (09වසර) සමත්ව තිබිය යුතු ය. |

02. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
(ii) අයදුම්කරු දකුණු පළාත තුළ අයදුම්පත් භාර ගන්නා දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.
(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතු ය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩ බල නොපානු ඇත.)
(iv) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටිය යුතු ය.
(v) කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාවේ අදාළ තනතුරේ ආදේශක/අනියම්/කොන්ත්‍රාත් තනතුරුවල සේවය කරන අය කෙරෙහි වැඩි අවධානය යොමු කරනු ලැබේ.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(vii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවනු ලබන කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙන් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා සභාපතිතුමා සතු ය.

03. *සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය:-

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතික ;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය ;
(iv) මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය ;
(v) මෑතක දී ලබා ගත් චරිත සහතික 02ක් ;
(vi) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vii) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික ;

04. *අයදුම් කළ යුතු ආකාරය :*

(i) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි (ඒ4 ප්‍රමාණයේ) අයදුම්පත් 2014.07.31 වැනි දිනට පෙර "සභාපති, කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව, කිරින්ද" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතු ය.
(iii) දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශයන් සහිතව එවිය යුතු ය.
(vi) අතින් ගෙනැවිත් භාරදෙන අයදුම්පත් භාරගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සනත් හෙට්ටිආරච්චි,
සභාපති,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 27 වැනි දින,
කිරින්ද,
කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව***

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ ........................................... තනතුර සඳහා බඳවා ගැනීම*

(1) (අ) මුලකුරු සමග නම :———————————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :———————————.

(2) ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———————————.

(3) ස්ථිර ලිපිනය:———————————.

(4) (අ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?:———————————.

(ආ) එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන්ද ?:———————————.

(5) ජාතික හැඳුනුම්පත් අංකය :———————————.

(6) ස්ත්‍රී/පුරුෂ භාවය:———————————.

(7) විවාහක/අවිවාහක තත්ත්වය:———————————.

(8) දුරකථන අංකය:———————————.

(9) උපන් දිනය

වර්ෂය:———————————. මාසය:———————————. දිනය:———————————.

(10) 2014.07.31 වැනි දිනට වයස :

අවුරුදු :———————————. මාස:———————————. දින:———————————.

(11) අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :———————————.

(12) වෘත්තීය සුදුසුකම් :———————————.

(13) සේවා පළපුරුද්ද:———————————.

(14) ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේ ද? :———————————.

(15) දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නම් ඒ පිළිබඳ විස්තර :———————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බවට ඔප්පු වුවහොත් මා පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු බව වන සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

———————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———————————.

*දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය ඃ*

මෙම අයදුම්කරු වන ........................................ මයා./මිය./මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ......................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනයම් ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. /නොකරමි.

———————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:———————————.
පදවි නාමය:———————————.
දෙපාර්තමේන්තුව/ආයතනය:———————————.
(නිල මුද්‍රාව යොදන්න)
දිනය:———————————.

07-399

## උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත විස්තර සඳහන් ප්‍රාථමික ශිල්පීය නොවන ප්‍රාථමික අර්ධ ශිල්පීය සහ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයන්ට අයත් තනතුරු සඳහා වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් 2008.11.19 හා 2009.05.12 යන දිනැතිව අනුමත කර ඇති බඳවාගැනීමේ පරිපාටිවල සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇති උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වසර 03 කට වැඩි කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ප්‍රාථමික ශිල්පීය සේවක ගණයේ "බරවාහන ක්‍රියාකරු" තනතුර සඳහා පමණක් කුරුණෑගල දිස්ත්‍රික්කය පුරා පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවන අතර, උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දී සුදුස්සන් නොමැති වුවහොත් දිස්ත්‍රික්කයේ අනෙක් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල පදිංචි උපරිම සුදුසුකම් ඇති අයදුම්කරු තෝරා ගනු ලැබේ.

| *තනතුර* | *සේවක ගණය* | *බඳවා ගන්නා ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|---|
| සෞඛ්‍ය කම්කරු | ප්‍රාථමික ශිල්පීය නොවන | III | 01 | රා.ප.ච. 6/2006(iv) හි පී.එල්. 01-2006-A අනුව රු.11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 |
| කාර්යාල කාර්ය සහායක | ප්‍රාථමික ශිල්පීය නොවන | III | 01 | රා. ප.ච. 6/2006 (iv) හි පී. එල්. 01-2006A අනුව රු.11,730-10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු.17,600 |
| විදුලි කාර්මික | ප්‍රාථමික අර්ධ ශිල්පීය | III | 01 | රා.ප.ච. 6/2006 (iv) හි පී.එල්.02-2006A - අනුව රු.12,210 - 10 x 130 - 10 x 145 -12 x 160 - 12 x 170 - රු.18,600 |
| බරවාහන ක්‍රියාකරු | ප්‍රාථමික ශිල්පීය | III | 01 | රා.ප.ච. 6/2006 (iv) හි පීඑල් 03-2006A අනුව රු.12,470- 10 x 130 - 10 x 145-12 x 160 - 12 x 170 රු.18,860 |
| රියදුරු | ප්‍රාථමික ශිල්පීය | III | 03 | රා.ප.ච. 6/2006 (iv) හි පී.එල්.03-2006A අනුව රු.12,470- 10 x 130 - 10 x 145 - 12 x 160 - 12 x 170 - රු.18,860 |

1. *සෞඛ්‍ය කම්කරු, කාර්යාල කාර්ය සහායක තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :-*

(i) *අධ්‍යාපන සුදුසුකම් :*
අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)
සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා රජය විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9වසර) සමත්වී තිබීම ප්‍රමාණවත්ය.

(ii) *වයස :*
අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
අදාළ බඳවාගැනීමේ පරිපාටියේ ක්‍රියාත්මක වන දිනය වන විට ප්‍රාථමික ශිල්පීය නොවන තනතුර අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

2. *විදුලි කාර්මික තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් :-*

(i) අධ්‍යාපන සුදුසුකම් :
*බාහිර අයදුම්කරුවන් සඳහා -*
අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර)
*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා -*
පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන පාසලකින් 8 ශ්‍රේණිය (9වසර) සමත්වීම.

(ii) *වයස :*
ඉහත ශිල්පීය නොවන තනතුර සඳහා අවශ්‍ය වයස් සීමා සහ විධිවිධාන මේ සඳහා ද අදාළ වේ.

(iii) *ශිල්පීය නිපුණතා :-*
රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ජාතික පුහුණු ආයතනයක හෝ විදුලි කාර්මික ශිල්පීය පිළිබඳ පුහුණු සහතිකය (NVQII හෝ III මට්ටමේ සහතිකයක් ලබා තිබීම.)

(iv) *පළපුරුද්ද :*
අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය විසින් පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර දෙකකට වැඩි කාලයක් සේවය කර තිබිය යුතුය. (සහතික මගින් සනාථ කළ යුතුය.)

3. *රියදුරු සහ බරවාහන ක්‍රියාකරු තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් :*

(i) *අධ්‍යාපන සුදුසුකම් :*
*බාහිර අයදුම්කරුවන් සඳහා -*
අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී යටත් පිරිසෙන් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් හයක්වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂය හැර) අවම වශයෙන් එක් වරකදී විෂයන් 05 ක් වත් සමත්වී තිබිය යුතුය.

*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*
මේ සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටිය වයඹ ගරු ආණ්ඩුකාරතුමන් විසින් අනුමත කරන ලද දිනය වූ 2009.05.12 දිනට ප්‍රථමයෙන් උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ටද පෞද්ගලිකව වන සේ එවකට පැවති බඳවාගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

(ii) *වයස :*
ඉහත 1 සහ 2 තනතුරුවලට අදාළ වයස් සීමා සහ විධිවිධාන මේ සඳහා අදාළ වේ.

(iii) *ශිල්පීය නිපුණතා :*

* මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද බරවාහන සහ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය
* බරවාහන යන්ත්‍ර ක්‍රියාකරු සඳහා අයි. ටී. ඒ. ටී. සහතිකය අවශ්‍ය වේ.

(iv) *පළපුරුද්ද :*

රියදුරු තනතුරු සඳහා බරවාහන රියදුරු වශයෙන් වසර 03 ක පළපුරුද්ද සහ බරවාහන ක්‍රියාකරු තනතුර සඳහා බරවාහන රියදුරෙකු වශයෙන් වසර 05 ක පළපුරුද්ද තිබීම අවශ්‍ය වේ.

*ඉහත සියලු තනතුරු සඳහා බඳවාගැනීමේ ක්‍රමය :*

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක සහ අදාළ වන පරිදි වෘත්තීය ප්‍රවීණතාව තහවුරුකර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. දැනටමත් අනියම්/ආදේශක/කොන්ත්‍රාත්/ගිවිසුම් මත සභාවේ සේවය කරන සේවකයින් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*ඉහත සියළුම තනතුරු සඳහා සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන්නේ අවු.03 පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළ සිය රාජකාරි වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබේ නම් පරිවාස කාලය අවසානයේදී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

*ඉහත සියලු තනතුරු සඳහා පොදු කොන්දේසි :*

1. සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වගන්ති අදාළ වේ.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
4. දණ්ඩනීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඩුවම් ලැබූවකු නොවිය යුතුය.
5. උඩුබද්දාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිකරුවකු බව සනාථ කිරීමේ ග්‍රාමසේවා සහතිකය ප්‍රාදේශීය ලේකම්තුමාගේ අනු අත්සන් සහිතව ඉදිරිපත් කළයුතුය.
6. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

*අයදුම්පත් එවිය යුතු පිළිවෙල :*

සියලුම අයදුම්කරුවන් මෙම පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2014.08.20 දිනට පෙර ලැබෙන සේ "ලේකම්, උඩුබද්දාව ප්‍රාදේශීය සභාව, උඩුබද්දාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් ඇමිණිය යුතුය:-

* උප්පැන්න සහතිකය
* අධ්‍යාපන සහතික

* ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය (රියැදුරු බලපත්‍රය - ශිල්පීය හා අර්ධ ශිල්පීය තනතුරු සඳහා),
* ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
* ග්‍රාම නිලධාරි සහතිකය,
* රියදුරු වශයෙන් වසර 03/05 කට වැඩි පළපුරුද්ද සම්බන්ධව සේවා සහතිකය/විදුලි කාර්මිකයෙකු වශයෙන් වසර 02 කට වැඩි පළපුරුද්ද පිළිබඳ සේවා සහතිකය.

ජේ. ඒ. සෝමසිරි ජයසිංහ,
ලේකම්,
උඩුබද්දාව ප්‍රාදේශීය සභාව.

2014 ජුනි මස 20 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ප්‍රාථමික ශිල්පීය/අර්ධ ශිල්පීය/ශිල්පීය නොවන සේවක සනයේ ................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :——————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම්:——————————.
2. තැපැල් ලිපිනය:——————————.
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:——————————.
4. උපන් දිනය: වර්ෂය:——————. මාසය:——————. දිනය:——————.
5. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ෘ අවුරුදු:—————.මාස:—————. දින:—————.
6. ජාතික හැඳුනුම්පත් අංකය:——————————.
7. විවාහක/අවිවාහක බව:——————————.
8. ජාතිය:——————————.
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද, එසේ නම් පරම්පරාවෙන්ද, ලියාපදිංචි වීමෙන්ද? යන බව:——————————.
10. අධ්‍යාපන සුදුසුකම්:——————————.
11. ශිල්පීය නිපුණතා:——————————.
12. වෘත්තීය පළපුරුද්ද:——————————.
13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,
    (i) දැනට දරන තනතුර:——————————.
    (ii) එම තනතුරට පත් වූ දිනය:——————————.
    (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම/සේවා ගිවිසුම් මත යන වග):——————————. (අදාළ පත්වීම් ලිපියේ ඡායා පිටපතක් අමුණන්න.)

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත්, දන්නෙමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

ආයතන ප්‍රධානියාගේ නිර්දේශය (සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණි.)

.....................................................................................................නම් අය මෙම ප්‍රාදේශීය සභාවේ....................... දින සිට (ස්ථිර/අනියම්/ආදේශක/දෛනික/කොන්ත්‍රාත්/සේවා ගිවිසුම්) සේවයේ යෙදෙන බව සහතික කරමි.

——————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :——————————.

07-525

## කුලියාපිටිය ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය නොවන III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති III වැනි ශ්‍රේණියේ ශිල්පීය නොවන පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ප්‍රමාණය | අධ්‍යාපන සුදුසුකම් | අවශ්‍ය ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා | පළපුරුද්ද |
|---|---|---|---|---|---|---|
| 01 | නළ ළිං පොම්පස කාර්මික | 01 | රු. 11,730 - 10 x 120 10 x 130 - 10 x 145 - 12 x 160- PL1-2006A | අ.පො.ස. (සා.පෙළ) විභාගයේ අවම වශයෙන් වැඩ 02 ක් සමත් වීම. (වෛකල්පිත විෂයයන් හැර) | තනතුරට අදාළ වෘත්තීය පුහුණු අධිකාරිය මගින් නිකුත් කරන වෘත්තීය පුහුණුව පිළිබඳ NVQ 02 හෝ 03 මට්ටමේ සහතිකයක් ලබා ගෙන තිබීම | අදාළ ක්ෂේත්‍රයේ පුහුණු කාලය හැර වසර 02ක ප්‍රායෝගික පළපුරුද්දක් ලබා තිබිය යුතුය. (සහතිකයක් මගින් සනාථ කළ යුතුයි) |
| 02 | ක්ෂේත්‍ර කම්කරු | 05 | එම | එම | - | - |
| 03 | මුරකරු | 02 | එම | එම | - | - |
| 04 | පුස්තකාල සහායක | 02 | එම | එම | - | - |
| 05 | සෞඛ්‍ය කම්කරු | 01 | එම | රජයේ අනුමත පාසලක 08 ශ්‍රේණිය හෝ 09 වසර සමත්වී තිබීම | - | - |

*01.අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

i. අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.
ii. අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර 03 කට නොඅඩු කාලයක් කුලියාපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (ඡන්ද හිමි නාම ලේඛනයේ හෝ ප්‍රාදේශීය ලේකම් නිකුත් කරන සහතිකයකින් සනාථ කළ යුතුයි.
iii. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවු: 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි. (දැනට ස්ථිර සේවයේ නියුතු අයට වයස් සීමාව බල නොපැවැත්වේ.)
iv. දණ්ඩ නීති සංග්‍රහයේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුයි.
v. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.

*02.බඳවා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගිවන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් සහ වාචික පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.
ii. වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.
iii. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
iv. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව,

ගරු වයඹ ආණ්ඩුකාරතුමා විසින් 2008.11.19 දින අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද මුදල් රෙගුලාසිවලට ද රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද වයඹ පළාත් සභාව හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටිය යුතුයි.

04. *අයදුම්පත් ඉදිරිපත් කිරීම* :

(i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත් 2014.08.18 දින හෝ එදිනට පෙර ලේකම්, කුලියාපිටිය ප්‍රාදේශීය සභාව, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
(ii) අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ.................. තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කර අයදුම්පත් එවිය යුතු ය.
(iii) අයදුම්පත් සමඟ පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය. :-

* උප්පැන්න සහතිකය ;
* අධ්‍යාපන සහතිකය ;
* අස්වීමේ සහතිකය;
* පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතිකකර තිබිය යුතු ය) ;
* මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක් ;
* වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික ;

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී හෝ මෙම බඳවා ගැනීම හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලය මා සතු ය.

ජේ. ඒ. සුජීවනී ජයසිංහ,
ලේකම්,
කුලියාපිටිය ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ ජුනි මස 26 වැනි දින,
කුලියාපිටිය,
කුලියාපිටිය ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.,

**ආදර්ශ අයදුම් පත්‍රය -**
**කුලියාපිටිය ප්‍රාදේශීය සභාව**

*කුලියාපිටිය ප්‍රාදේශීය සභාවේ ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීම - 2014*

............................................................................................ *තනතුර සඳහා අයදුම් පත්‍රය*

1. අයදුම්කරුගේ නම මුලකුරු සමග :————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.
3. ස්ථිර ලිපිනය:————————.
4. ග්‍රාම නිලධාරි කොට්ඨාසය:————————.
5. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:————————.
6. දිස්ත්‍රික්කය:————————.
7. උපන් දිනය -වර්ෂය:————————. මාසය:————————. දිනය:————————.
8. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :
අවුරුදු :————————. මාස:————————. දින:————————.
09. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් වන්නේ පරම්පරාවෙන් ද යන වග :————————.
11. විවාහක/අවිවාහක යන වග :————————.
12. ජාතික හැඳුනුම්පත් අංකය:————————.
13. අධ්‍යාපන සුදුසුකම්:————————.

අ.පො.ස. (සා/පෙ.) විභාගය :————————.
සමත් වර්ෂය හා විභාග අංකය :————————.

| *අනු. අංකය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |

14. *වෘත්තීය හා වෙනත් සුදුසුකම්* :——————————.

15. *සේවා පළපුරුද්ද* :——————————.

(i) දැනට සේවය කරන ආයතනය :——————————.
(ii) දැනට දරන තනතුර :——————————.
(iii) එම තනතුරට පත් වූ දිනය :——————————.
(iv) මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————.

*දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය* :

මෙම ඉල්ලුම්කරුවන .............................. මයා./මිය./මෙනවිය දැනට මෙම ආයතනයේ ............................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශකර ඉදිරිපත් කරමි/නොකරමි.

——————————.
ආයතන ප්‍රධානියාගේ හෝ බලය පවරනු ලැබූ නිලධාරියාගේ අත්සන.

නම:——————————.
පදවි නාමය:——————————.
ආයතනය:——————————.
දිනය:——————————.

07-429

---

# පළාත් පාලන නිවේදන

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය ප්‍රකාර කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2014.05.27 දින පවත්වන ලද මහා සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත්, අදාල ඉඩම් හිමියන් විසින් සභාව වෙත දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග - පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට්* පත්‍රයේ පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග- පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 30 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*මාර්ග විස්තරය*

| *දිග* | *පළල* |
|---|---|
| මීටර් 300 (අඩි984) | මීටර් 3.6 (අඩි12) |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | පමුණුගමවත්ත හරහා මොට්ටප්පුලිය මාර්ගය |
| වසම | - | මොට්ටප්පුලිය |
| ආරම්භය | - | සේනානායක මාවත |
| අවසානය | - | පමුණුගමවත්ත |

සේනානායක මාවතින් ආරම්භව වම් පසින් පී. ඒ. ඩී. ඒ. එස්. ඒ. වික්‍රමසිංහ යන අයට අයත් පමුණුගමවත්ත යන ඉඩමින් ද,

දකුණු පසින් ඇළ මාර්ගයකින් ද මායිම් වන්නාවූ පමුණුගම වත්ත හරහා මොට්ටප්පුලිය මාර්ගය.

*මාර්ග විස්තරය*

| *දිග* | *පළල* |
|---|---|
| මීටර් 1,200 (අඩි 3936) | මීටර් 2.4 (අඩි8) |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | උඩුගම ප්‍රධාන මාර්ගයේ සිට පහලගම අරඹේපොල යාය දක්වා මාර්ගය |
| වසම | - | උඩුගම ගොන්දෑවල |
| ආරම්භය | - | උඩුගම ප්‍රධාන මාර්ගය |
| අවසානය | - | උඩුගම පහළගම |

උඩුගම ප්‍රධාන මාර්ගයේ සිට ආරම්භ වන වම් පසින් යූ. එම්. සුරංග මධුශංක සෙනවිරත්න යන අයට අයත් කුඹුක්ගහමුලවත්ත (දෙනිය කුඹුර), ජී. එම්. අවංගිරා යන අයට අයත් බූකැන්දගොල්ල වත්ත, ජී. එම්. ගුණදාස යන අයට අයත් බූකැන්දගොල්ලවත්ත, එච්. එම්. සුනිල් හේරත් යන අයට අයත් තෝරතැන්න වත්ත හෙවත් බූකැන්දගොල්ල වත්ත, එස්. එම්. කේ. උඩුගම යන අයට අයත් වැලිකන්ද කුඹුර, කේ. එම්. නිමල් විජේරාජ යන අයට අයත් දෙබෝව කුඹුර, එච්. ආර්. සුනිල් හේමන්ත කුමාර යන අයට අයත් වැලිකන්ද කුඹුර යන ඉඩම්වලින් ද,

දකුණු පසින් යූ. එම්. සුරංග මධුශංක යන අයට අයත් කුඹුක්ගහමුලහේන වත්ත, ඊ. එම්. ප්‍රේමාවතී යන අයටත අයත් කුඹුක්ගහමුලවත්ත (මුත්තෙට්ටුවේ හේන), එන්. එස්. බංඩාර යන අයට අයත් වල් අරඹේවත්ත, ආර්. ආර්. කිත්සිරි බංඩාර යන අයට අයත් පිල්ලෑව වත්ත, අයි. ජී. ජයමන් යන අයට අයත් දෙබෝව කුඹුර, ජේ. ඒ. ජයකොඩි මැණිකේ යන අයට අයත් අරඹිපොල කුඹුර, එච්. එම්. සීතාවතී මැණිකේ යන අයට අයත් අටලාහ කුඹුර, එස්. ආර්. අබේනායක මැණිකේ යන අයට අයත් වරකා පල කුඹුර යන ඉඩම්වලින් මායිම් වන්නා උඩුගම ප්‍රධාන මාර්ගයේ සිට පහලගම අරඹේපොල යාය දක්වා මාර්ගය.

*මාර්ග විස්තරය*

| *දිග* | *පළල* |
|---|---|
| මීටර් 121 (අඩි 397) | මීටර් 3.66 (අඩි 12) |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | කිරිවල්ලාපිටිය අශෝක විද්‍යාල මාවතේ පළමු පටුමග |
| වසම | - | මඩවල |
| ආරම්භය | - | කිරිවල්ලාපිටිය අශෝක විද්‍යාල මාවත |
| අවසානය | - | වරිපණම් අංක 03/09 නිවස |

කිරිවල්ලාපිටිය අශෝක විද්‍යාල මාවතින් ආරම්භවන වම් පසින් කේ. ඒ. නිමල් අමරසිංහ යන අයට අයත් කුරුකැප්පිටිය වත්ත, පී. ජී. පී. කුමාරි විජේරත්න සහ කේ. ජී. කුසුම් ශ්‍රියාලතා, පී. කේ. ආර්. ධර්මසේන යන අයවලුන්ට අයත් සේරුගහමුල හේන යන ඉඩම්වලින් ද,

දකුණු පසින් පී. ඩී. කුසුමාවතී පෙරේරා, පත්මා රාණි සෙනවිරත්න යන අයවලුන්ට අයත් සේරුගහමුල හේන යන ඉඩම් වලින් ද මායිම් වන්නාවූ කිරිවල්ලාපිටිය අශෝක විද්‍යාල මාවතේ පළමු පටුමඟ මාර්ගය.

*මාර්ග විස්තරය*

| දිග | පළල |
|---|---|
| මීටර් 310 (අඩි 1017) | මීටර් 2.4 (අඩි 8) |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | හීනාබෝව පන්සල මාර්ගය |
| වසම | - | කන්සලගමුව |
| ආරම්භය | - | බෝකුඹුර |
| අවසානය | - | පන්සල් වත්ත |

හීනාබෝව පන්සල මාර්ගයෙන් ආරම්භ වී වම් පසින් එම්. ආර්. ආර්. එස්. සූරියබංඩාර, එච්. ආර්. පී සන්ධ්‍යා කුමාරි, එල් ආර් බංඩාර මැණිකේ යන අයවලුන්ට අයත් අම්බලන්පිටියේ වත්ත, එච්. එම්. රංජිත් විමල් හේරත් සහ පී. පී. ආර්. පුංචි මහත්තයා යන අයවලුන්ට අයත් අම්බලන්පිටියේ වත්ත (බෝකුඹුර), කේ. විමලානන්ද හිමියන්ට අයත් අම්බලන්පිටිය වත්ත (පන්සල් වත්ත) එච්. එම්. ජයතිලක යන අයට අයත් බෝකුඹුර යන ඉඩම් වලින් ද, දකුණු පසින් ඇළ මාර්ගයකින් ද මායිම් වන්නා වූ හීනාබෝව පන්සල මාර්ගය.

*මාර්ග විස්තරය*

| *දිග* | *පළල* |
|---|---|
| මීටර් 800 (අඩි 2694) | මීටර් 2.4 (අඩි 8) |

| | | |
|---|---|---|
| මාර්ගයේ නම | - | වැලිලියද්ද පාලමේ සිට මහ කුඹුර කෙළවර දක්වා පාර |
| වසම | - | කණුගොල්ල |
| ආරම්භය | - | වැලිලියද්ද කුඹුර (පාලම ළඟ) |
| අවසානය | - | මහකුඹුර |

පරපේ මැදගම වැලිලියද්ද කුඹුර ළඟින් (පාලම ළඟින්) ආරම්භව වම් පසින් එම්. ඩී. සෝමාවතී, ඩී. ජී. විල්සන් රූපසිංහ, ඩී. ජී. චන්ද්‍රදාස, ආර්. ඩී. සොපියා, එම්. ජී. විල්සන් විජේසිරි, එම්. ජී. නිමල් මුණසිංහ, ආර්. ඩී. එම්. ජයන්ති ධර්මදාස යන අයවලුන්ට අයත් ගම වෙලේ පිහිටි වැලිලියද්ද නොහොත් ඉද්දගහපැල කුඹුර, එම්. ජී. වික්ටර් ගුණසිංහ, යූ. ඩී. ජයරත්න, එම්. ජී. ආනන්ද මුණසිංහ යන අයවලුන්ට අයත් වැලිලියද්ද කුඹුර සහ කලුගේ කුඹුර, පී. ජී. ප්‍රේමාවතී යන අයට අයත් කලුගේ කුඹුර (වැලිලියද්ද) ආර්. එස්. ප්‍රේමරත්න, ඒ. ජේ. ධර්මදාස, ඒ. ඩී. සුනිල් පියරත්න යන අයවලුන්ට අයත් මහ කුඹුර ඒ. ඩී. එම්. සෝමරත්න යන අයට අයත් කරලියගහ කුඹුර සහ මහ කුඹුර යන ඉඩම්වලින් ද,

වම් පසින් ඇළ මාර්ගයකින් ද මායිම් වන වැලිලියද්ද පාලමේ සිට මහ කුඹුර කෙළවර දක්වා මාර්ගය.

07-498

---

**කටුවන ප්‍රාදේශීය සභාව**

දියුණු කළ ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ අගෝස්තු මස 26 දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 7-6 යටතේ සභා සම්මත කරන ලද පහත

සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස් ආර්. ජී. කන්නන්ගර විසින් අංක හපපා/.ඩී.යූ.5/පොදු /03/09/බ.ප්‍ර දරන 2014.01.08 දිනැති ලිපිය මගින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයි. ජී. මහින්ද,<br>සභාපති,<br>කටුවන ප්‍රාදේශීය සභාව.

2014 ජූනි මස 11 වැනි දින,<br>කටුවන ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් ප්‍රාදේශීය සභා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලබාගැනීමට ක්‍රියා කළ යුතු බවටත්, කටුවන ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

***උපලේඛනය***

1 කොටස - කටුවන කලාපය

කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 532- රණසිංහගොඩ හා 534- වීරක්කුට්ටිගොඩ, හා 535- කටුවන හා 536- පංගම්විලයාය දරන ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළට අයත් වන්නා වූ අදාළ මායිම් පහත දැක්වේ.

උතුරට : අංක 534, 535, 536 හා 512 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
නැගෙනහිරට : අංක 533,529,534 හා 535 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද, දකුණට : අංක 548,532,538 හා 537 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
බටහිරට : අංක 538, 535,536 හා 513 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,

2 කොටස - *මිද්දෙනිය කලාපය* :

කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 496- මුරුංගස්යාය බටහිර හා 498-මිද්දෙනිය උතුර, හා 499-මිද්දෙනිය බටහිර හා 500 මිද්දෙනිය නැගෙනහිර දරන ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළට අයත් වන්නා වූ අදාළ මායිම් පහත දැක්වේ.

*උතුරට* : අංක 500,501,502, 501 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
*නැගෙනහිරට* : අංක 499,499,510,498 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
*දකුණට* : අංක වීරකැටිය ප්‍රා. ලේ. කොට්ඨාසය 496 වීරකැටිය ප්‍රා.ලේ. කොට්ඨාශය 495 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
*බටහිරට* : අංක 495,500,498,494 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,

3 කොටස - කිරම කලාපය :

කටුවන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති අංක 551- වෙළඳගොඩ හා 552- මාපිටකන්ද, දරන ග්‍රාම නිලධාරි කොට්ඨාස තුළට අයත් වන්නා වූ අදාළ මායිම් පහත දැක්වේ.

*උතුරට* : අංක 552,550 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
*නැගෙනහිරට* : අංක 458,451 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
*දකුණට* : අංක 456,450 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,
*බටහිරට* : අංක 452,449 දරන ග්‍රාම නිලධාරි වසම් වලින් ද,

07-609

---

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පලවූ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දන්වන අතර, ඉදිරියේ දී මෙම මාර්ගවලට අයත් ඉඩම්වලින් අදාළ බිම් ප්‍රමාණය අත්පත් කර ගැනීමට කටයුතු යොදන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුල යම් විරුද්ධත්වයක් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සභාපති/ලේකම්,<br>කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව.

**කඹුරුපිටිය ප්‍රාදේශීය සභාව - මාර්ග ලියාපදිංචි කිරීම**

| *පාරේ නම* | *ග්‍රාමනිලධාරි වසම* | *දෙපස ඇති ඉඩම් වම* | *දකුණ* | *ආරම්භය* | *අවසානය* | *දුර මීටර්* | *පළල අඩි* |
|---|---|---|---|---|---|---|---|
| දොලවත්ත පාර | මාපලාන මගින් ඉහල | ගොරකගහවත්ත පොල්අඹගහකොරටුව කිරිවැල්හේන දොල පොල්අඹගහ කොරටුව මහහේන කිරිවැල්හේනදොල | පරගහ ගොරටුව | පරගහකොරටුව | කිරිවැල්ලහේන හා ගොරකගහ දොල වත්ත | 150 | 10 |
| සමුපකාරය අසල කෝංගහහේන දක්වා වූ මාර්ගය | ඌරපොල නැගෙනහිර | මීගහකොරටුව යහලේ ගෙදර කෝංගහකොරටුව | කෝංගහ හේන1 කෝංගහ හේන 2 කෝංගහ හේන 3 කෝංගහ හේන 4 කෝංගහ හේන 5 | ග්‍රාමීය බැංකුව | ගෙපලෙ ඉඩම අසල සිට | 125 | 12 |

07-400

---

# විවිධ දැන්වීම්

**බණ්ඩාරවෙල මහා නගර සභාව**

රථවාහන මගින් ජංගම වෙළඳාම් කිරීම සඳහා ගාස්තු අයකිරීම

බණ්ඩාරවෙල මහ නගර සභා සීමාව තුල රථවාහන උපයෝගී කරගෙන ජංගම වෙළඳාම් කටයුතු කරනු ලබන අයවලුන් වෙතින් පහත උපලේඛනයේ දැක්වෙන මාසික ගාස්තු ප්‍රමාණයන් 2014.06.11 දින සිට නැවත සංශෝධනය කරනු ලබන තෙක් අයකිරීම සුදුසු බවට 2014.06.11 දින බණ්ඩාරවෙල මහා නගර සභාවේ දී තීරණය කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එම්. එන්. දිසානායක,
නාගරික කොමසාරිස්,
බණ්ඩාරවෙල මහා නගර සභාව.

2014 ජුනි මස 11 වැනි දින,
බණ්ඩාරවෙල මහා නගර සභාවේ දී ය.

**උපලේඛනය**

| *වෙළඳාම් කරන රථය* | *මාසික ගාස්තු මුදල* *රු.* |
|---|---|
| ලොරි රථයකින් ජංගම වෙළඳාම් කිරීම | 3,000 0 |
| වෙනත් රථයකින් ජංගම වෙළාදාම් කිරීම | 1,000 0 |

07-611

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.